# ප්‍රවාහන අමාත්‍යාංශය

# කාර්යසාධන වාර්තාව - 2020

**7 වෙනි මහල**
**සෙත්සිරිපාය, අදියර II**
**බත්තරමුල්ල**

**2021 - ජූලි**

## පටුන

පිටු අංකය

**01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය**
1.1 හැඳින්වීම
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු
1.3 ප්‍රධාන කාර්යන්
1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන
1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු
1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

**02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**
විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

**03 පරිච්ඡේදය - 2020 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය**
3. 1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරනු ලබන ප්‍රතිපාදන
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව (ඇමුණුම - 01)

**04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක**
4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

**05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**
5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ**
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලබන ආකාරය
6.3 මානව සම්පත් සංවර්ධනය

**07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව**

# 01 පරිච්ඡේදය

## 1.1 හැඳින්වීම

රටක ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා ප්‍රවාහන සේවාව අත්‍යාවශ්‍යම සාධකයකි. නිෂ්පාදනයන් සුරක්ෂිතවත් කාර්යක්ෂමවත් වෙළඳපොළ කරා ප්‍රවාහනය කිරීමත්, ශ්‍රම බලකායට නිසි වෙලාවට සුවපහසු ලෙස සේවා ස්ථාන වෙත ළඟා වීමට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීමත් මෙහිදී ඉතා වැදගත් වේ. ආර්ථික සංවර්ධනයට සමගාමීව ප්‍රවාහනයට ඇති ඉල්ලුම වැඩි වීමත් සමඟ පැන නැගී ඇති වාහන තදබදය, රිය අනතුරු වැඩි වීම හා පරිසර දූෂණය වැනි ගැටලු සැලකිල්ලට ගනිමින් ප්‍රවාහන ක්ෂේත්‍රයට කාලානුරූපී වෙනස්කම් එක් කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රය නව මාවතක් කරා යොමු කිරීමට ප්‍රවාහන අමාත්‍යාංශය විවිධ ව්‍යාපෘති / වැඩසටහන් දියත් කරමින් සිටී.

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති රාමුවට අනුකූලව අමාත්‍යාංශයට අයත් ආයතනවල දායකත්වය යටතේ තිරසාර ප්‍රවාහන අවශ්‍යතා සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීම, සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම මඟින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රවාහන සේවයක් සැපයීම ප්‍රවාහන අමාත්‍යාංශයේ මූලික කාර්යභාරයයි. ඒ අනුව, දුම්රිය ප්‍රවාහනය වැඩිදියුණු කිරීම සඳහා නව දුම්රිය මාර්ග ඉදි කිරීම, නව බලවේග කට්ටල, මගී මැදිරි මිලදී ගැනීමේ කටයුතු මෙන්ම දුම්රිය මාර්ග, ගොඩනැගිලි, පාලම් සහ සංඥා පද්ධතිය යන අංශයන්හි සංවර්ධන හා නඩත්තු කටයුතු සිදු කෙරෙමින් පවතී. තවද, තොරතුරු තාක්ෂණය හා අත්වැල් බැඳගනිමින් මගීන් සඳහා පහසු හා විශ්වාසදායි පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමයක් හඳුන්වා දීම සහ ජංගම දුරකථන හා අන්තර්ජාලය ඔස්සේ බස් සේවා පිළිබඳ තොරතුරු ලබා ගැනීම හා ආසන වෙන් කරවා ගැනීම සඳහා මෘදුකාංගයක් සකස් කිරීම ආදී කටයුතු ද ක්‍රියාත්මක වෙමින් පවතී. මීට අමතරව, සමාජ සුබ සාධන ක්‍රියාවලියක් ලෙස "හප්පා පලා යෑම" නිසා වින්දිත වූ පවුල් 34 කට වන්දි පිරිනැමීම සිදු කරන ලදී.

2020 වසරේ ඇතිවූ කොවිඩ් - 19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේ දී දුම්රිය දෙපාර්තමේන්තුවේ ආදායම සැලකිය යුතු අන්දමින් පහත වැටුණි. කෙසේ වුවද, සෞඛ්‍යාරක්ෂිත පියවර රැසක් ගනිමින් ජනතාවට ප්‍රවාහන සේවා බාධාවකින් තොරව සැපයීම සඳහා කටයුතු කරන ලද අතර, දුම්රිය සේවාව කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා ප්‍රසම්පාදනය, මගී මැදිරි හා දුම්රිය මාර්ග පුනරුත්ථාපනය සහ දුම්රිය ස්ථානයන්හි සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම ආදී කටයුතු සිදු කරන ලදී. තවද, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මගී සේවා අවසරපත්‍ර ලබා දී ඇති අන්තර් පළාත් බස්රථ ධාවනය මුළුමනින්ම අත්හිටුවීමට සිදුවීම හේතුවෙන් අවසර පත්‍ර යාවත්කාලීන කිරීමේ ගාස්තු හා මිල ගණන් කැදවීමේ දී ගෙවිය යුතු ගාස්තු අයකර ගැනීමට සහන කාලයක් ලබා දෙන ලදී. තවද පෞද්ගලික මගී ප්‍රවාහන කර්මාන්තය සුරක්ෂිත කිරීමේ අරමුණෙන් යුතුව රාජ්‍ය බැංකු හරහා රුපියල් ලක්ෂ 3ක සහන ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

මීට අමතරව, ජනතාවට සෞඛ්‍යාරක්ෂිත ප්‍රවාහන පහසුකම් සැපයීමට ප්‍රමුඛතාවය ලබාදෙමින් බස් පර්යන්ත විෂබීජහරණය කිරීම, අත් සේදීම සඳහා පහසුකම් සැලසීම සහ 2020.03.16 දින සිට රජය නිවාඩු දින ප්‍රකාශ කිරීමත් සමඟ ජනතාවට කොළඹ හා තදාසන්න නගරවල සිට ගම්බිම් කරා යාම සඳහා කඩිනම් ප්‍රවාහන සේවා සැපයීමට කටයුතු කරන ලදී.

2020 වසරේදී පෙර මහනගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද මහකොළඹ ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සහ සහසර බස් රථ නවීකරණ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති දෙක විශේෂයෙන්ම මගී සේවා බස් රථ කළමනාකරණය සඳහා වැදගත් වැඩසටහන් සම්පාදනය කිරීමට කටයුතු ආරම්භ කර ඇත.

අමාත්‍යාංශය වෙත පැවරී ඇති කර්තව්‍යයන් වඩාත් ඵලදායිව හා කාර්යක්ෂමව ඉටු කිරීම හා අයවැය ප්‍රතිපාදන මනා කළමනාකාරිත්වයක් සහිතව යොදා ගැනීම සඳහා ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ හා එකී තීරණ ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යාංශයේ සියලු අංශ හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විශාල මෙහෙවරක් ඉටු කරමින් සාර්ථක ප්‍රතිඵල ලබා ගත් වසරක් ලෙස 2020 වසර හැඳින්විය හැක.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

**දැක්ම**

ශ්‍රී ලංකාව කලාපය තුළ ප්‍රමුඛතම මහජන කේන්ද්‍රීය ප්‍රවාහන පද්ධතිය සහිත රට බවට පත් කිරීම.

**මෙහෙවර**

ජනතාවගේ ජීවන තත්ත්වයන් නගා සිටුවීම උදෙසා නව්‍යතම තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතා කරමින් ඉතා උසස් ප්‍රවාහන යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය සහ තිරසාරව පවත්වාගෙන යාම.

**අරමුණු**

- මගීන්, භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ සංචාරක ප්‍රවාහන පහසුකම් සැපයීම.
- මහජන විශ්වාසය දිනා ගනිමින් රථවාහන තදබදය සහ මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහා කාලසටහනකට අනුව ප්‍රවාහන සේවා පවත්වාගෙන යාම.
- ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම.
- මහාමාර්ග හා දුම්රිය මාර්ගවලට සම්බන්ධ පරිසර හිතකාමී සහ මගී හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කිරීම.
- 1991 අංක 37 දරණ ජාතික ප්‍රවාහන කොමිෂන් පනත සහ 1950 අංක 18 දරණ දුම්රිය පනත ක්‍රියාත්මක කිරීම

## 1.3 ප්‍රධාන කාර්යන්

1. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "කාර්යක්ෂම සහ පරිසර හිතකාමී පොදු ප්‍රවාහන පද්ධතියක් සඳහා ප්‍රවාහන ජාලය සංවර්ධනය කිරීම" සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව ප්‍රවාහන විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන් හා කාර්යයන් හා ඊට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
    - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
    - ජාතික ගමනාගමන කොමිෂන් සභාව
    - මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

2. පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා නීති රීති සකස් කිරීම.

3. පොදු ප්‍රවාහන පද්ධතිය කෙරෙහි ජනතා විශ්වාසය හා මාර්ග පහසුකම් ඇති කිරීම සඳහා ඉහළ ප්‍රමිතියක් ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

4. මාර්ග තදබදය, මගී තදබදය හා මාර්ග අනතුරු අවම කිරීම සඳහා අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ, නීති රීති හඳුන්වා දීම.

5. රාජ්‍ය හා පෞද්ගලික ප්‍රවාහන සේවා හා දුම්රිය සේවා පොදු කාලසටහනකට අනුව ඒකාබද්ධ ආකෘතියක් යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවයක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නවීන තාක්ෂණ ඊ - ටිකට් ක්‍රමයක් හඳුන්වා දීම.

6. දුම්රිය හා බස් රථ නැවතුම්පොළ ආශ්‍රිත පොදු පහසුකම් හා ආරක්ෂාව තහවුරු කිරීමට අදාල යටිතල පහසුකම් සංවර්ධනය

7. දුම්රිය හා බස් රථ සේවාව සඳහා අවශ්‍ය දුම්රිය හා බස් රථ නඩත්තු කිරීම.

8. බස් රථ නිෂ්පාදන හා ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාල දේශිය කර්මාන්ත පද්ධතියක් ගොඩනැගීමට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදයන් හඳුන්වා දීම.

9. කොළඹ, හම්බන්තොට, කන්කසන්තුරෙයි සහ ත්‍රිකුණාමල වරායන් වෙත දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම හා පුළුල් කිරීම.

10. තොරතුරු තාක්ෂණයේ යෙදීම මඟින් මෝටර් රථ ලියාපදිංචිය ජනතා හිතකාමී, කාර්යක්ෂම, දූෂණයෙන් තොර ක්‍රියාවලියක් බවට පත් කිරීම.

## 1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන

## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

1. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

## 1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

1. ජාතික ගමනාගමන කොමිෂන් සභාව
2. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම | ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|
| මාතර - කතරගම නව දුම්රිය මාර්ග ව්‍යාපෘතිය | Exim Bank (China) | ඇ.ඩො. මිලියන 278.2 | 2020.12.31 දිනට ව්‍යාපෘතිය අවසන් කර ඇත. |
| කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව<br>ශ්‍රී ලංකා රජය | රු. මිලියන 1,456.50<br>රු. මිලියන 9,798.04 | 2016 - 2023 |
| දුම්රිය කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව<br>ශ්‍රී ලංකා රජය | රු. මිලියන 28,232.00<br>රු. මිලියන 5,646.40 | 2019 - 2025 |

# 02 පරිච්ඡේදය

## ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රගතිය හා අනාගත දැක්ම ...

මගී කේන්ද්‍රීය හා සංවිධානගත ප්‍රවාහන පද්ධතියක් රටක සංවර්ධනයට අත්‍යවශ්‍ය අංගයක් වන අතර, මහජනතාවගේ අවශ්‍යතාවයන්ට සරිලන ලෙස ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රවාහන සේවාවක් සැපයීම ප්‍රවාහන අමාත්‍යාංශයේ ප්‍රමුඛතම කාර්යභාරය වේ. ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ආර්ථික සංවර්ධනයේ ඉලක්කගත නව මාවතක් සොයා යන ගමනේ රටක පවතින බහුවිධ සේවාවන් අතරින් අත්‍යවශ්‍ය සේවාවක් වන ප්‍රවාහන පද්ධතිය ද ඒ හා සමාන්තරව සංවර්ධනයක් කරා ළඟා විය යුතුය. රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව වන "සෞභාග්‍යයේ දැක්ම" හා අනුකූල වෙමින් ප්‍රවාහන අමාත්‍යාංශය සිය කාර්ය සාධනය ඉලක්කගත ප්‍රතිඵල ළඟා කර ගැනීමට ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇත.

ප්‍රවාහන සේවා සංවර්ධනය උදෙසා වාර්ෂික අයවැය මඟින් වෙන් කරනු ලැබූ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමුඛ හා ඵලදායී ප්‍රවාහන අංශවල ආයෝජනය කරමින් 2020 වසර තුළ වැඩසටහන් හා ව්‍යාපෘති රාශියක් ක්‍රියාවට නංවා සාර්ථක ප්‍රතිඵල ළඟා කර ගෙන ඇත.

ඒ අනුව, බස් හා දුම්රිය කේන්ද්‍ර කර ගනිමින් පොදු ජනතාවට කාර්යක්ෂම හා ලාභදායී ප්‍රවාහන සේවාවක් ලබා දීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාව මේ වනවිට පියවර රැසක් ගෙන ඇත. දුම්රිය ප්‍රවාහනය වැඩි දියුණු කිරීම සඳහා මහව - ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය, දකුණු පයාගල - අලුත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීමේ ව්‍යාපෘතිය හා පොල්ගහවෙල - කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කරනලදි. තවද, මගී හා භාණ්ඩ දුම්රිය ප්‍රවාහනය කාර්යක්ෂමතාව වර්ධනය කිරීම අරමුණු කොට ගනිමින් නව දුම්රිය හරස් මාර්ග 200ක් ස්ථාපනය කිරීම සඳහා ටෙන්ඩර් ප්‍රදානය කොට ඇත.

නව දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘති යටතේ, මාතර - කතරගම දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ පළමු අදියර මේ වනවිට අවසන් කර දුම්රිය ධාවනය කාර්යක්ෂමව සිදුවන අතර, දෙවන අදියර ලෙස බෙලිඅත්ත සිට කතරගම දක්වා නව දුම්රිය මාර්ගය ඉදි කිරීම සඳහා පූර්ව ශක්‍යතාවය අධ්‍යයනය කිරීමේ කටයුතු සිදු කිරීමට නියමිතය. ආසියානු සංවර්ධන බැංකුවේ දායකත්වයෙන් ක්‍රියාත්මක වන කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (CSRP) යටතේ ඉඩම් අත්පත් කර ගැනීම, වන්දි ලබා දීම හා නැවත පදිංචි කිරීමේ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී. ඉහත ව්‍යාපෘතියට සමගාමීව ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (REIP) ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය යටතේ දීප ව්‍යාප්ත දුම්රිය විදුලි සංදේශ පද්ධතිය සහ දීප ව්‍යාප්ත දුම්රිය ප්‍රවේශපත් මිලදී ගැනීමේ පද්ධතියට අදාල මිලදී ගැනීම් මේ වන විට සිදු කර ඇත. කුරුණෑගල - හබරණ නව දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ මේ වන විට මූලික මිනුම් කටයුතු, පස් පරීක්ෂා කිරීමේ කටයුතු සහ ජල විද්‍යාත්මක අධ්‍යයන කටයුතු මේ වන විට අවසන් කර ඇත.

ගුණාත්මක හා ජනතා හිතවාදී මාර්ග ප්‍රවාහනයක් උදෙසා ප්‍රමුඛතාවය ලබාදෙමින් සහනදායී ගාස්තු ක්‍රමයක් යටතේ පාසල් සිසුන් වෙනුවෙන් ක්‍රියාත්මක වන "සිසු සැරිය" හා ග්‍රාමීය ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් අඛණ්ඩව විශ්වාසනීයව හා ලාභදායීව සැපයීම අරමුණු කර ගෙන ඇති කරන ලද "ගැමි සැරිය" හා "නිසි සැරිය" බස් රථ සේවාවන් මේ වන විට සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වේ. ඒ අනුව 2020 වසරේ දී සිසු සැරිය නව සේවා 49 ක්, නිසි සැරිය නව සේවා 13 ක් හා ගැමි සැරිය නව සේවාවක් ආරම්භ කරන ලදි. මීට අමතරව මාකුඹුර බහුවිධ හුවමාරු මධ්‍යස්ථානය මූලික කර ගෙන Park and Ride පහසුකම ආරම්භ කිරීම සඳහා මූලික සමීක්ෂණ සිදු කරන ලදි.

නවීන තාක්ෂණය මුසු කරමින් අගය එකතු කල පොදු ප්‍රවාහන සේවාවක් ස්ථාපිත කිරීම සඳහා පහසු හා විශ්වාසදායී පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමයක් හඳුන්වා දීමට පියවර ගනිමින් "Back End" මෘදුකාංගය මිලදී ගැනීමට අවශ්‍ය ටෙන්ඩර් කටයුතු ආරම්භ කොට ඇත. තවද, ජංගම දුරකතනය හා අන්තර්ජාලය ඔස්සේ

බස් රථ සේවා පිළිබඳ තොරතුරු ලබා ගැනීම හා බස් රථ ආසන වෙන් කරවා ගැනීම සඳහා “Mybus - SL ”නමින් ජංගම දුරකතන මෘදුකාංගයක් සකස් කිරීම ආදී කටයුතු සිදු කර ඇත.

2020 මාර්තු මස ඇති වූ කොවිඩ් - 19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේදී දුම්රිය සේවාව කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා ප්‍රසම්පාදනය, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම ඇතුළු සේවාවන් අඛණ්ඩව සිදු කෙරුණි. තවද, බැස්ටියන් මාවත බස් පර්යන්තය ආශ්‍රිතව විෂබීජහරණය, අත් සේදීම සඳහා පහසුකම් සැලසීම ඇතුළු සෞඛ්‍ය ආරක්ෂිත පියවර රැසක් ගන්නා ලදි. මීට අමතරව, ඇඳිරි නීතිය පනවා තිබූ කාලය තුල 1955 ක්ෂණික දුරකථන ඇමතුම පැය 24 පුරා ක්‍රියාත්මකව පවත්වාගනිමින් ජනතාව විසින් පොදු ප්‍රවාහනය සම්බන්ධයෙන් කරනු ලබන විමසීම් වලට පිළිතුරු ලබාදීමට කටයුතු කරන ලදී.

මාර්ග අනතුරුවලින් තොර සමාජයක් බිහි කිරීමේ අරමුණින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මගින් පාසල් 10 ක ශිෂ්‍ය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පාසල් මාර්ග ආරක්ෂණ කලාප ස්ථාපිත කිරීම සිදු කරන ලද අතර සමාජ සුබ සාධන ක්‍රියාවලියක් ලෙස “හප්පා පලා යෑම” නිසා වින්දිත වූ පවුල් 34 කට වන්දි පිරිනැමීම සිදු කරන ලදී. ඒ අනුව, 2020 වසර අවසාන වන විට හඳුනා නොගත් මාර්ග අනතුරු වලට ලක් වූ වින්දිතයින්ට රු. ලක්ෂ 42.75 ක වන්දි ප්‍රදානය කර ඇත. තවද, “දරුවන් සුරැකි ගමනක ද?” යන තේමාව මුල් කර ගනිමින් ශ්‍රී ලංකා ඔටෝමොබයිල් සංගමය, ශ්‍රී ලංකා පොලීසිය සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව එක්ව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් හම්බන්තොට දිස්ත්‍රික්කය මූලික කර ගනිමින් හිටපු ගරු ප්‍රවාහන අමාත්‍යතුමාගේ ප්‍රදානත්වයෙන් සිදු කරන ලදි.


තවද ශ්‍රී ලංකාව සතුව පවතින සමස්ථ මගී ප්‍රවාහන බස්රථ සංඛ්‍යාවෙන් 2/3 වඩා ප්‍රමාණයක හිමිකාරිත්වය පෞද්ගලික අංශය සතුවන අතර මෙම සේවාව සඳහා විධිමත් කළමනාකරණ ක්‍රමවේදයක් සැකසීමට "සහසර" බස් මගී ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය විසින් ආරම්භ කර ඇති අතර කොළඹ හා ප්‍රධාන නගර වල පවතින වාහන තදබදය අවම කිරීමේ අරමුණ ඇතිව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ කටයුතු සහ බස් කළමනාකරණය සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වාදීමේ කටයුතු මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (3K) මගින් ආරම්භ කර ඇත.

රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ අභියෝග ජය ගනිමින් තිරසාර සංවර්ධනයක් කරා යන ගමනේ පළමු පියවර වන්නේ පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කර මගී ජනතාව ඒ සඳහා ආකර්ෂණය කර ගැනීමයි. ඒ සඳහා අප රටට ගැළපෙන විද්‍යාත්මක පර්යේෂණ ප්‍රතිඵල පාදක කර ගත් නවීන තාක්ෂණය පොදු ප්‍රවාහනයේ උන්නතිය උදෙසා යොදා ගත යුතුය. ප්‍රවාහන ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ දැනුම ප්‍රවාහන කර්මාන්ත ක්ෂේත්‍රයට ලබා දීම සඳහා පර්යේෂකයන් සහ ප්‍රවාහන පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් හා සන්නිවේදනයක් ගොඩ නඟා ගැනීම ඉතා වැදගත් වේ.

ප්‍රවාහන ක්ෂේත්‍රය රටක සෑම අංශයකම ඉදිරි ගමන කෙරෙහි බලපාන තීරණාත්මක සාධකයකි. රටක් ලෝක ආර්ථික ප්‍රවණතා සමඟ නිවැරදිව සමපාතවීමෙහිලා ද ප්‍රවාහන අංශය වැදගත්කමක් උසුලයි. එබැවින්, ප්‍රවාහන ක්ෂේත්‍රයේ පවතින අඩුපාඩු සපුරා ගැනීම සඳහා සැලසුම් සහගත ඉදිරි දැක්මකින් යුතුව කටයුතු කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින් සියලුම ප්‍රවාහන පාර්ශවකරුවන්ගේ ඍජු දායකත්වය සමඟ ප්‍රවාහන අමාත්‍යාංශය විසින් 2021-2025 ගොඩබිම් ප්‍රවාහනය උදෙසා මධ්‍යකාලීන සැලැස්මක් සම්පාදනය කිරීමේ කටයුතු 2020 වසරේ අග භාගයේ දී අවසන් කරන ලදි. එම සැලැස්ම යථාර්තයක් බවට පත් කර ගනිමින් ජනතාවට ඉතා උසස් ප්‍රමිතියෙන් යුත් කාර්යක්ෂම ප්‍රවාහන සේවාවන් ලබාදීම මෙම අමාත්‍යාංශයේ අරමුණයි.

**එන්. බී. එම්. රණතුංග**
ලේකම්
ප්‍රවාහන අමාත්‍යාංශය

# ප්‍රවාහන අමාත්‍යාංශය



# 03 පරිච්ඡේදය

## 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

රු.

| අයවැය 2020 | | සටහන | තත්‍ය 2020 | තත්‍ය 2019 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | | 24,049,292,729 | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | | 24,049,292,729 | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | | 24,049,292,729 | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 11,047,156,399 | 17,213,285,456 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 13,194,696 | 12,140,695 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 13,360,288 | 11,581,564 | ඒසීඒ-5/5(ඒ) |
| - | වෙනත් ලැබීම් | | 105,125,473 | 18,920,731 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **11,178,836,855** | **17,255,928,445** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **11,178,836,855** | **41,305,221,174** | |

**අඩුකළා : වියදම්**

| | | | | | |
|---|---|---|---|---|---|
| - | **පුනරාවර්තන වියදම්** | | **-** | **-** | |
| 141,889,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | **5** | 141,618,362 | 147,332,392 | |
| 148,717,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | **6** | 146,492,653 | 169,060,848 | **ඒසීඒ-2(ii)** |
| 651,955,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | **7** | 403,809,824 | 13,859,861,283 | |
| - | පොළී ගෙවීම් | **8** | - | - | |
| 317,000 | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | 316,653 | - | |
| 942,878,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඇ)** | | **692,237,491** | **14,176,254,523** | |
| | **මූලධන වියදම්** | | | | |
| 1,207,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 401,458 | 845,194 | |
| 11,564,118,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 8,992,727,539 | 4,133,251,654 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | 2,659,618,807 | **ඒසීඒ-2(ii)** |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 720,000 | හැකියා වර්ධනය | **14** | 381,500 | 639,200 | |
| 4,460,247,000 | වෙනත් මූලධන වියදම් | **15** | 4,202,109,482 | - | |
| 16,026,292,000 | **මුළු මූලධන වියදම් (ඉ)** | | **13,195,619,979** | **6,794,354,855** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **22,266,559** | **23,082,546** | |
| | **තැන්පතු ගෙවීම්** | | **11,513,727** | **12,820,733** | **ඒසීඒ-4** |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 10,752,832 | 10,261,813 | **ඒසීඒ-5/5(ඒ)** |
| | **මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)** | | 13,910,124,029 | 20,993,691,925 | |
| 16,969,170,000 | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | (2,731,287,174) | 20,311,529,249 | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-පී**

**2020 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | 2020 | 2019 |
|---|---|---|---|
| | | තත්‍ය | |
| | | රු. | රු. |
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 49,524,851,468 | 41,141,155,251 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 31,609,959 | 34,217,415 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 713,805 |
| **මුළු වත්කම්** | | **49,556,461,427** | **41,176,086,471** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| ශුද්ධ වත්කම් | | 29,218,596 | 33,507,021 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 49,524,851,468 | 41,141,155,251 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(ආ) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 2,391,363 | 710,394 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 713,805 |
| **මුළු වගකීම්** | | **49,556,461,427** | **41,176,086,471** |

පිටු අංක 4 සිට 62 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 63 සිට 80 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර, මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| …………………… | ……………… | ………………………………….. |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි |
| නම : එන්.කී.එම්. රණතුංග | නම : | නම: ඒ.ඒ.ටී.කේ.අදිකාරි |
| තනතුර: ලේකම් | තනතුර : | දිනය : |
| දිනය : | දිනය : | |

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-සී**

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තතය | |
|---|---|---|
| | **2020 රු.** | **2019 රු.** |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 28,891,821 | - |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 11,247,597 | 22,817,804 |
| අග්‍රිම ලැබීම් | 11,047,156,399 | 17,213,285,456 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **11,087,295,817** | **17,236,103,260** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 285,893,255 | 152,157,969 |
| සහනාධාර සහ මාරුකිරීම් වියදම් | 7,850,000,000 | 16,835,897,448 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | - | 154,964,924 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 713,805 | |

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **8,136,607,060** | **17,143,020,341** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **2,950,688,757** | **93,082,919** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | 1,061,793 | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | - | 1,456,308 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **1,061,793** | **1,456,308** |
| **<u>අඩුකළා - මුදල් වැය කිරීම්:</u>** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 2,948,144,923 | 86,559,909 |
| අත්තිකාරම් ගෙවීම් | 8,026,468 | 8,428,986 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **2,956,171,391** | **94,988,895** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(2,955,109,598)** | **(93,532,587)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **(4,420,841)** | **(449,668)** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 10,706,242 | 5,273,811 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **10,706,242** | **5,273,811** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |

| | | |
|---|---:|---:|
| තැන්පතු ගෙවීම් | 6,285,401 | 4,824,143 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **6,285,401** | **4,824,143** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **4,420,841** | **449,668** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

### 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

-

### 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. 000,

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| අදාළ නැත | | | | | |

### 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000,

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 922,978,000 | 942,878,000 | 692,237,491 | 73.42 |
| ප්‍රාග්ධන | 14,080,292,000 | 16,026.292,000 | 13,195,619,979 | 82.34 |

**3.7** මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු000, .

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | අභ්‍යාසලාභී උපාධිධාරින් වෙත දීමනා ගෙවීම | 1,200,000 | 1,200,000 | 1,197,204.30 | 99.77% |
| | ආර්ථික කටයුතු අමාත්‍යාංශය | | 2,800,000 | 2,800,000 | 2,651,848.94 | 94.71% |

**3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.000,

| වත්කම් කේතය | කේත විස්තරය | **31.12.2020** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **31.12.2020** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැඟිලි හා ව්‍යුහයන් | | 1,637,965,081 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 509,769,275 | | |
| 9153 | ඉඩම් | | 3,933,309,595 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | - | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | 43,445,807,517 | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | - | | |

**3.9** විගණකාධිපතිවරයාගේ වාර්තාව **

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව
ඇමුණුම 01 මඟින් දැක්වේ.

# 04 පරිච්ඡේදය

**කාර්ය සාධන දර්ශක**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | **100% - 90%** | **75% - 89%** | **50% - 74%** |
| **දුම්රිය අංශය** | | | |
| ➢ භාණ්ඩ ප්‍රවාහන දුම්රිය සංඛ්‍යාව | | | √ |
| ➢ දිනකට ක්‍රියාත්මක වන දුම්රිය සංඛ්‍යාව | √ | | |
| ➢ ප්‍රධාන දුම්රිය ව්‍යාපෘති සංඛ්‍යාව | √ | | |
| ➢ ඉදි කළ දුම්රිය මාර්ග (දිග කි.මී) | √ | | |
| **බස් රථ අංශය** | | | |
| ➢ නව සිසු සැරිය , ගැමි සැරිය, හා නිසි සැරිය බස් රථ සේවා සංඛ්‍යාව | | | √ |
| ➢ වසරකට පුහුණු කරන ලද බස් කාර්යමණ්ඩල සංඛ්‍යාව | | | √ |
| ➢ ක්‍රියාත්මක කරන ලද කාලසටහන් සංඛ්‍යාව (ඒකාබද්ධ සහ ඒකාබද්ධ නොවන) | | √ | |
| **අමාත්‍යාංශයේ කාර්ය සාධන දර්ශක** | | | |
| ➢ පවත්වා ඇති ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව | | | √ |
| ➢ පොදු ප්‍රවාහන සේවාව කාර්යක්ෂම කිරීම උදෙසා ක්‍රියාත්මක වන ව්‍යාපෘති සංඛ්‍යාව | √ | | |
| ➢ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා ලබා දී ඇති පුහුණුවීම් සංඛ්‍යාව | | | √ |
| ➢ පාර්ලිමේන්තුව වෙත වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු වාර්තා සංඛ්‍යාව | √ | | |
| ➢ අමාත්‍යාංශය වෙත ලැබෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් වැය කරන ලද ප්‍රතිශතය | | √ | |
| ➢ වර්ෂය තුළ පවත්වා ඇති විගණන හා කළමනාකරණ කමිටු සංඛ්‍යාව | | √ | |
| ➢ අමාත්‍යාංශය විසින් මාසිකව හා කාර්තුමය වශයෙන් අදාල ආයතන වෙත ඉදිරිපත් කළ යුතු ප්‍රගති වාර්තා සංඛ්‍යාව | √ | | |

## 05 පරිච්ජේදය

**තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

**5.1** හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| නීරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම | 2030 වන විට මහා මාර්ගවල සිදු වන අනතුරුවලින් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම | මරණ අනුපාතය (2019 වසරට සාපේකෂව) | √ | | |
| නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්ත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින් සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහා මාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරීම මඟින් 2030 වන විට සියලුම දෙනාට ආරක්ෂාකාරී අඩු මිලට ලබා ගත හැකි ප්‍රවේශ විය හැකි සහ තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම. | 1. භාණ්ඩ ප්‍රවාහන දුම්රිය සංඛ්‍යාව | | √ | |
| | | 2. දිනකට ධාවනය කරන දුම්රිය සංඛ්‍යාව | | | √ |
| | | 3. ප්‍රධාන දුම්රිය ව්‍යාපෘති සංඛ්‍යාව | | | √ |
| | | 4. නව සිසු සැරිය , ගැමි සැරිය, හා නිසි සැරිය බස් රථ සේවා සංඛ්‍යාව | | √ | |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූල වෙමින් 2030 වර්ෂය වනවිට ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ශක්තිමත් ප්‍රවාහන සේවාවක් ඇති කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය පියවර රැසක් මේ වනවිට දියත් කර ඇත.

11 වන තිරසාර සංවර්ධන ඉලක්කය වන 2030 වන විට සැමට සුරක්ෂිත, දැරිය හැකි, ප්‍රවේශ විය හැකි සහ තිරසාර ප්‍රවාහන පද්ධති සඳහා ප්‍රවේශය ලබා දීම, මාර්ග ආරක්ෂාව වැඩි දියුණු කිරීම, පොදු ප්‍රවාහන සේවය පුළුල් කිරීම සහ  කාන්තාවන්, ළමයින්, ආබාධිත පුද්ගලයින් සහ වැඩිහිටි පුද්ගලයින්ගේ අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම යටතේ ප්‍රවාහන අමාත්‍යාංශය විවිධ වැඩසටහන්/ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව, පරිසර හිතකාමී සහ ආර්ථික ප්‍රතිලාභ සහිත ප්‍රවාහන පහසුකමක් වන Park and Ride ක්‍රමය යටතේ පොදු බස් සේවාවක් ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. දිනෙන් දින ඉහල යන ප්‍රවාහන ඉල්ලුම හමුවේ පොදු බස් සේවා සඳහා මගීන් ආකර්ෂණය කරගැනීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය  තුළින් උදෑසන සහ සවස් කාලයේ කාර්ය බහුල වේලාවන්වල දී ඇතිවන මාර්ග තදබදය අවම කිරීම, ප්‍රවාහන සේවා සඳහා යොදාගන්නා ඉන්ධන භාවිතය අඩුකිරීම, වාහන විමෝචක මඟින් සිදුවන පරිසර දූෂණය අවම කිරීම, මාර්ග අනතුරු අවම කිරීම සහ කාලය ඉතුරු කරගැනීම අපේක්ෂා කරයි.

තවද, දරුවන්ට ආරක්ෂිත සහ විශ්වසනීය පොදු ප්‍රවාහන බස් රථ සේවාවක් ලෙස "සිසුසැරිය" සහ නගරයෙන් දුරස්ථව ජීවත්වන ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වන "ගැමිසැරිය" සහ රාත්‍රී හා අලුයම් කාලයේ ප්‍රවාහන සේවා සැපයීම සඳහා ක්‍රියාත්මක වන "නිසිසැරිය" සේවාව මේ වන විට සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වේ.

9 වන තිරසාර සංවර්ධන ඉලක්කය යටතේ කලාපීය හා අන්තර් දේශ සීමා යටිතල පහසුකම් ඇතුළුව ගුණාත්මක, විශ්වසනීය, තිරසාර හා ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ප්‍රමුඛතාවය ලබා දෙමින් ක්‍රියාත්මක කරන ලද මාතර - කතරගම දුම්රිය මාර්ග ව්‍යාපෘතිය, කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ග ව්‍යාපෘතිය සහ කොළඹ තදාසන්න දුම්රිය මාර්ග ව්‍යාපෘතිය හරහා කාර්යක්ෂම පොදු ප්‍රවාහනයක් ජනතාවට ලබා දීමට හැකිවනු ඇත. මීට අමතරව, දුම්රිය ඇණිය ශක්තිමත් කිරීම සඳහා නව දුම්රිය කට්ටල මිලදී ගැනීම, මගී මැදිරි පුනරුත්ථාපනය කිරීම සහ දුම්රිය ඇණියේ අඛණ්ඩ නඩත්තු හා අලුත්වැඩියා කටයුතු ද සිදු කරන ලදී. තවද, මගී පහසුව සහ ආරක්ෂාව සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් දුම්රිය වේදිකා ඉස්සීම සහ දීර්ඝ කිරීමේ කටයුතු සිදු කරන ලදී.

3 වන තිරසාර සංවර්ධන ඉලක්කය වූ මාර්ග අනතුරු වලින් සිදුවන ගෝලීය මරණ හා තුවාල සංඛ්‍යාව අඩකින් අඩු කිරීමේ ඉලක්කය පෙරදැරි කරගනිමින් මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් පාසල් 10 ක ශිෂ්‍ය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පාසල් මාර්ග ආරක්ෂණ කලාප ස්ථාපිත කිරීම සිදු කරන ලදී.

තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමේ දී ප්‍රවාහන අමාත්‍යාංශයට විවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදුවේ. ප්‍රධාන අභියෝග වශයෙන් විශාල ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ආයෝජන සපයා ගැනීමේ ගැටලු , වැඩ වර්ජන හා සේවක ගැටලු, ඉඩම් ගැටලු උදාහරණ වශයෙන් දැක්විය හැකිය. ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධව සිදු කරන පර්යේෂණ ප්‍රතිඵල ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට ප්‍රයෝගිකව යොදා ගැනීමේදී  ඇතිවන දුර්වලතා ද තිරසර අරමුණු ජය ගැනීමේ දී ඍණාත්මක ලෙස බලපා ඇත. එමෙන්ම, නව තාක්ෂණය සහිත සොයා ගැනීම් සඳහා ඉඩප්‍රස්ථාව අඩුවීම ද වර්තමාන තත්ත්වයට ඍජුවම බලපා ඇත.

# 06 පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 24 | 21 | 3 |
| තෘතියික | 4 | 4 | 0 |
| ද්විතියික | 96 | 92 | 4 |
| ප්‍රාථමික | 55 | 51 | 4 |

### 6.2 * ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපාන අයුරු

අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර ඉටු කරලීම වෙනුවෙන් ඉලක්කගත අරමුණුවලට ළඟාවීමේ දී මානව සම්පත් හිඟය සෘජු බලපෑමක් සිදු කරන අතර, අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට වැයවන කාල සීමාවන්හි දීර්ඝ වීමක් සිදු වීමේ හැකියාවක් ඇත.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රුපියල්) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම * |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| Eighty – Second Annual Session of the UN Economic Commission for Europe (UNECE) Inland Transport Committee (ITC) | 01 | පෙබරවාරි 23 – 29 | - | 690,524.51 | විදේශීය | |
| Transport and Climate change week 2020 | 01 | මාර්තු 01– 07 | - | 120,169.72 | විදේශීය | |
| Higher National Diploma in Public Procurement and Contract Administration 2020/2021 | 01 | මාස 14 | 120,000.00 | - | දේශීය | |
| Master of Law (L.L.M.) | 01 | අවු. 02 | 151,500.00 | - | දේශීය | |
| MPM (2018-2020) | 01 | අවු. 02 | 100,000.00 | - | දේශීය | |
| ආයතන සංග්‍රහය පිළිබඳ හා කාර්ය මණ්ඩල පටිපාටිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | 25 | දින 01 | 10,000.00 | - | දේශීය | |
| **මුළු ආයෝජනය** | | | **381,500.00** | **810,694.23** | | |

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන අයුරු

අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරින් හා අනෙකුත් නිලධාරින් පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම තුළින් අමාත්‍යාංශය තුළ තමන්ට නියම වී පවතින රාජකාරී වඩාත් නිවැරදිව හා කාර්යක්ෂමව පවත්වා ගැනීමට හැකියාව ලැබී ඇත. තවද මාණ්ඩලික නිලධාරින් විදේශීය පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම තුළින් ලබන අත්දැකීම් තම රාජකාරියට අනුකූල කර ගැනීම හා එමඟින් කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සිදු කර ඇත. එමෙන්ම විදේශීය පුහුණු ලැබීම තුළින් නිලධාරින් අභිප්‍රේරණය වන අතර, ඒ තුළින් ලබා ගන්නා දැනුම හා කුසලතා උපයෝගී කර ගනිමින් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනයක් ඇති කරලීමට හැකියාව ලැබී ඇත. (ඒ හා සම්බන්ධව සහතික පත්‍ර හා වාර්තාවන් අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.)

# 07 පරිච්ඡේදය

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලින කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිගත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | අනෙකුත් ආයතන සහ ව්‍යාපෘතිවලින් නියමිත දිනට පිළිතුරු වාර්තා නොලැබීම. | මේ පිළිබඳව ආයතන සහ ව්‍යාපෘති දැනුවත් කර ඇත. |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1- 2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ජා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල නොවේ | කොරෝනා වසංගත තත්ත්වය නිසා නිලධාරීන් අඩු පිරිසක් රාජකාරියට වාර්තා කිරීම. | අංශයේ සියලුම නිලධාරීන් 2021 වර්ෂයේ පැමිණීමට අපේක්ෂිත බැවින්, ගැටලුකාරී නොවේ. |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | වාහන අපහරණය කිරීම සඳහා වාහනවල අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමේ කටයුතු ප්‍රමාද වීම. | අදාල වාහනවල අයිතිය විධිමත් පරිදි අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට අවශ්‍ය තොරතුරු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළපසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශ වෙනස්වීම, අමාත්‍යාංශයේ විෂය පථය වෙනස්වීම, පාලනාධිකාරියේ හා කාර්ය මණ්ඩලයේ වෙනස්වීම හා පවතින කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම කාර්යන් ප්‍රමාද වී ඇති අතර, ඉදිරියේ දී මීට අදාල කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශ වෙනස්වීම, අමාත්‍යාංශයේ විෂය පථය වෙනස්වීම, පාලනාධිකාරියේ හා කාර්ය මණ්ඩලයේ වෙනස්වීම හා පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙම චක්‍රලේඛ ප්‍රකාර කාර්යන් සිදු කිරීම ප්‍රමාද වී ඇති අතර, ඉදිරියේ දී මීට අදාල කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල නොවේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |